ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.05.26

පැමිණිලිකාර පාර්ශවය : කේ.පී. චමින්ද මයා,
11/ඒ, අමුණුගොඩ,
ඉඹුල්ගොඩ.

වගඋත්තරකාර පාර්ශවය : සභාපති,
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව,
කොළඹ 09.

පැමිණිලි අංකය : එච්ආර්සී/1143/22

පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල මගින් පහත සඳහන් කරුණු මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර සිටී. පැමිණිලිකරු වගඋත්තරකාර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහකාර පිරිපහදු කාර්මික ශිල්පියෙකු වශයෙන් සේවය කරන අතර එකී සංස්ථාව විසින් 2020.09.16 වන දින ජ්‍යෙෂ්ඨ කාර්මික ඉංජිනේරු තනතුර සඳහා කාර්මික ශිල්පීන් පත් කර ගැනීම සඳහා කැඳවන ලද අභ්‍යන්තර නිවේදනයට අනුව පැමිණිලිකරු විසින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු වගඋත්තරකාර සංස්ථාව විසින් අභ්‍යන්තරව 2021.11.10 වන දින පවත්වන ලද ලිඛිත පරීක්ෂණය සහ 2021.11.11 වන දින පවත්වන ලද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ද පෙනී සිට ඇත. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලදී පැමිණිලිකරුට 62 % ක ලකුණු මට්ටමක් ලැබී ඇත.

ඉන් අනතුරුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු ඉදිරිපත් වී ඇති අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු ලබාදීමේදී පැමිණිලිකරුට ලකුණු 20 න් ලකුණු 04 ක් ලබාදී ඇත. පැමිණිලිකරු කියා සිටින්නේ 2015.05.26 වන දින 1/1163 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව වගඋත්තරකාර සංස්ථාවේ CPC Criteria & Marking Scheme for Recruitments & Promotions හි 6 වන ඡේදය යටතේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය දක්වා ඇති බවත් එහිදී උපරිම ලකුණු 20 ක සීමා වී කාණ්ඩ 03 ක් යටතේ පිළිවෙලින් ලකුණු 5, 7, 8 යනුවෙන් ලකුණු ලබාදීමේ පිළිවෙතක් අනුගමනය කරන බවත් ය. ඒ අනුව, පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ පැමිණිලිකරු සහභාගී වන ලද සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තනි තනිව ලබා දෙන ලද ලකුණු සහ සෙසු සියලුම අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා යන අංශය සඳහා ලකුණු ලබා දුන් ආකාරය ඇතුළත් ලේඛන වල සහතික පිටපත් ලබා දෙන ලෙසයි. එසේම, අතිරේක සුදුසුකම් හා ක්‍රියාකාරකම් යටතේ ලකුණු ලබාගෙන නොමැති ඩබ්.ඩී. තිලකරත්න (13757) යන අයට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු 19 ක් ලබා දී ඇති ආකාරය සම්බන්ධයෙන් සළකා බලන ලෙසත් පැමිණිලිකරු ඉල්ලා සිටී.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අපේක්ෂිත සහනය

01. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කාර්මික ශිල්පී (වැද්දුම්කරු) තනතුරට අදාළ සියලුම දීමනා සහ වරප්‍රසාද සහිතව පැමිණිලිකරු B-1 ශ්‍රේණියේ පිහිටුවීම.

02. 2022.03.21 වන දින හෝ ඊට ආසන්න දිනකදී B-1 ශ්‍රේණියෙහි තනතුරෙහි පිහිටව පැමිණිලිකරු සමග සම්මුඛ පරීක්ෂණයට සහභාගිවූවන්ගේ B-1 ශ්‍රේණියේ පිහිටවූ දින සිටම ක්‍රියාත්මක කිරීම.

උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකාර සහ වගඋත්තරකාර යන දෙපාර්ශවයෙහි සහභාගීත්වයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේදී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර වගඋත්තරකරු විසින් සිය ස්ථාවරය පහත සඳහන් පරිදි දක්වා ඇත.

2021.12.15 වන දින පිරිපහදුවේ බී/1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කාර්මික ශිල්පී තනතුරට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී සංස්ථාවේ බඳවාගැනීම් හා උසස්වීම් ක්‍රියාපටිපාටීන් පිළිගත් ලකුණු ලබාදීමේ ක්‍රියාපිළිවෙතට අනුව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, වාර්ෂික වේතනාධික ඇගයීම්, ජ්‍යෙෂ්ඨත්වය යන කාණ්ඩාංක වලට අදාළව එක් එක් අපේක්ෂකයින් සේවා කාලය තුළදී උපයාගෙන ඇති ලකුණු නිවැරදිව ඇතුළත් කර ඇති අතර ඒවා පාරදෘශ්‍ය හා විනිවිදභාවයකින් යුතුව ලබාදී ඇති බවට කරුණු දක්වා ඇති බැවින් පැමිණිලිකරු පරීක්ෂණයේදී එය පිළිගෙන ඇත.

ඊට අමතරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබාදීමේදී අනුමත ලකුණු ලබාදීමේ ක්‍රියාපිළිවෙතට පටහැනිව ලකුණු 04 ක් ලබා දී ඇති බවත් එසේම අතිරේක සුදුසුකම් හා ක්‍රියාකාරකම් යටතේ ලකුණු ලබාගෙන නොමැති ඩබ්.ඩී. තිලකරත්න (13757) යන අයට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු 19 ක් ලබාදී පැමිණිලිකරුට අසාධාරණයක් සිදුකර ඇති බවට කරුණු දක්වා ඇත. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් ආකාරයට සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දුන් පිළිතුරු සහ උසස්වීම් ලැබීමට නියමිත තනතුරට අදාළව ඔහුගේ විෂය ක්ෂේත්‍ර දැනුම යන කරුණු පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සාමූහිකව සාකච්ඡා කර එම අවස්ථාවේදී ගනු ලබන ඒකමතික තීරණයට අනුව (Collective decisions) ලකුණු ලබාදීම සිදු කෙරේ. නමුත් එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලකුණු ලබාදීම සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් ලේඛන පවත්වාගෙන යාමක් සිදු නොකරන අතර එම ක්‍රියාපටිපාටිය මෙම සම්මුඛ පරීක්ෂණයේදී පමණක් නොව සංස්ථා ඉතිහාසයේ මේ දක්වා පැවති සෑම සම්මුඛ පරීක්ෂණයකදීම අනුගමනය කරන ක්‍රියාපටිපාටිය වේ. තවද සංස්ථාවේ දැනට බලපවත්නා බඳවා ගැනීම් හා උසස්වීම් ක්‍රියාපටිපාටියට හා චක්‍රලේඛවලට අනුව ඒ ආකාරයෙන් වෙන් වෙන් වශයෙන් සම්මුඛ පරීක්ෂණයේ සාමාජිකයින් විසින් ලකුණු ලබාදී ඇති ලේඛන පවත්වා ගැනීමටද නියමයක් නොමැති බැවින් පැමිණිල්ල විසින් කර ඇති ඉල්ලීමට අනුව ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි බව දැනුම් දී ඇත.

මෙම ප්‍රශ්නගත කාරණයේදී මූලිකවම අවධානය යොමු විය යුතු කාරණය වන්නේ අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම වෙනුවෙන් වෙන් කරන ලද ලකුණු 20 ලබාදීමේදී වගඋත්තරකරු විසින් අනුගමනය කළ ක්‍රියාපටිපාටිය නිවැරදිව සහ සාධාරණ වූ එකක් ද යන්නයි. 2021.12.15 වන දින බී/1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කාර්මික ශිල්පී තනතුරට අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණයේ දී ඒ ඒ අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 20 ලබා දුන් ආකාරය පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| පී.ජී. ජයතිලක මයා | - | ලකුණු | 12 |
| ඩී.පී ජයවීර මයා | - | ලකුණු | 18 |
| ඩබ්.ඩී. තිලකරත්න මයා | - | ලකුණු | 19 |
| කේ.පී. චමින්ද මයා (පැමිණිලිකරු) | - | ලකුණු | 04 |
| ඩී.එම්.එන්.එස්. දිසානායක මයා | - | ලකුණු | 18 |
| ජේ.ආර්.අයි.එස්. බණ්ඩාර මයා | - | ලකුණු | 19 |
| ඩී.වී.එම්. මදනායක මයා | - | ලකුණු | 12 |
| ඩබ්.ජ්.ඩී.එස්.පී.කේ. දිසානායක මයා | - | ලකුණු | 08 |
| එම්. තහීර් තසීම් මයා | - | ලකුණු | 08 |
| කේ. සුනිල් මයා | - | ලකුණු | 19 |
| ඩී.ජී. යෝගානන්ද මයා | - | ලකුණු | 18 |
| ඩබ්.එම්. ප්‍රියන්ත මයා | - | ලකුණු | 12 |

මෙහිදී නිරීක්ෂණය වන්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු 20 න් අවම ලකුණු සංඛ්‍යාවක් පැමිණිලිකරුට ලබාදී ඇති බවයි. පැමිණිලිකරු අභියෝගයට ලක් කර සිටින අදාළ තනතුරට තේරී පත්වුණු ඩබ්.ඩී. තිලකරත්න යන අයදුම්කරුට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 19 ක් ලබා දී ඇත. එම අයදුම්කරු ලකුණු 62.66 ක් ලබා ඇති අතර පැමිණිලිකරුගේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 61.46 ක් වේ.

සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා සඳහා ලකුණ ලබාදීමේදි අනුගමනය කළ ක්‍රමවේදය කුමක්ද යන්න මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණ වලදී වගඋත්තරකරු වාචිකව සහ සිය ලිඛිත දේශන මගින් පැහැදිලි කරදී නැත. ඒ අනුව නිරීක්ෂණය වන්නේ පැහැදිලි විනිවිදභාවයකින් යුතුව අදාළ ලකුණු 20 ලබාදීමේදී සාධාරණවූ ක්‍රමවේදයක් වගඋත්තරකරු විසින් අනුගමනය කර නොමැති බවයි. එහිදි ලකුණු ලබා දුන් ආකාරය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලේඛනයක් හෝ පවත්වාගෙන ගොස් නොමැත. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ සාකච්ඡා කර සාමූහික එකගතාවක් මගින් අදාළ ලකුණු තීරණය කර ඇති බව ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරුට සෙසු අංශ යටතේ ලකුණු 57.11 ක් හිමිවී ඇති අතර අභියෝගයට ලක් කරන ඩබ්.ඩී. තිලකරත්න යන අයට සෙසු අංශවලට ලකුණු 39.77 පමණක් හිමිවී ඇත. නමුත්, නිසි විනිවිදභාවයකින් තොර සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 20 ලබාදීමේදී පැමිණිලිකරුට ලකුණු 04 ක්ද අභියෝගයට ලක් කරන ඩබ්.ඩී.තිලකරත්න නමැති අයදුම්කරුට ලකුණු 19 ක් ද ලබාදි පැමිණිලිකරුට වඩා වැඩි ලකුණු 1.20 ක් ඉක්මවායාම මත අදාළ තනතුර ලබාදී ඇත.

වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු 20 හිමිවන්නේ එක් එක් අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත්විමේ හැකියාව, භාෂා දැනුම, ධනාත්මක ආකල්ප සහ විශ්වාසය, අභියෝග භාර ගැනීමට ඇති හැකියාව, පැහැදිලි දැක්ම සහ අනාගත සැලසුම් හා ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයට අදාළ විෂය දැනුම, අවබෝධය සහ පැහැදිලිව ප්‍රතිචාර දැක්වීම යන කරුණු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සාමූහිකව සාකච්ඡා කොට ඇගයීමකට ලක් කර එම අවස්ථාවේදි ගනු ලබන තීරණයකට අනුව ලකුණු ලබාදිම සිදු කරන නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාමාජිකයින් වෙන් වෙන් වශයෙන් ලකුණු ලේඛන පවත්වාගෙන

යාමක් සිදු නොකරන බවයි. සංස්ථා ඉතිහාසයේ සිට මේ දක්වා පැවති සෑම සම්මුඛ පරික්ෂණයකදීම ලකුණු ලබාදීමේදී ඉහතින් සඳහන් කළ නිර්නායකයන්ට අනුව පාරදෘශ්‍ය හා විනිවිදභාවයකින් යුතුව ලකුණු ලබා දෙන බැවින් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී නොමැති බවයි.

නමුත්, 2015.05.26 වන දිනැති 1/1163 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව වගඋත්තරකාර සංස්ථාවේ CPC Criteria & Marking Scheme for Recruitments & Promotions හි 6 වන ඡේදය ප්‍රකාරව සම්මුඛ පරික්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය පැහැදිලිව දක්වා ඇති අතර වගඋත්තරකරු විසින් එය අනුගමනය කර අදාළ ලකුණු ලබාදී තිබේද යන්න ගැටළුවකි.

උක්ත ක්‍රමවේදයෙහි දක්වා ඇත්තේ සම්මුඛ පරික්ෂණයේ ලකුණු 20 බාහිර හෝ අභ්‍යන්තර අයදුම්කරුවන්ට පහත සඳහන් ආකාරයට ලබා දිය යුතු බවයි. එනම්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම ක්‍රමවේදයට අනුකූලව කටයුතු කළයුතු බවයි.

| කාණ්ඩය | උපරිම ලකුණු 20 |
|---|---|
| ඉදිරිපත් කිරීමේ කුසලතා / භාෂා ප්‍රවීනත්වය | 05 |
| ධනාත්මක ආකල්ප සහ විශ්වාසය, නව අභියෝගවලට මුහුණදීමට ඇති සූදානම / අනාගත ලගාගර ගැනීම් සඳහා පවතින පැහැදිලි දැක්ම හා සැලැස්ම | 07 |
| අදාළ දැනුම සහ විෂයට අදාළ අත්දැකීම් / වගකීම් දැරීමට ඇති හැකියාව | 08 |
| මුළු ලකුණු | 20 |

මෙම CPC Criteria & Marking Scheme for Recruitments & Promotions හි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණ ඇගයීම් ලකුණු ලබා දියයුතු ක්‍රමවේදය ඉතා පැහැදිලිව සඳහන් කර ඇතත් වගඋත්තරකරු විසින් එය අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, වැඩිදුරටත් නිරීක්ෂණය වන්නේ වගඋත්තරකරු විසින් සම්මත ක්‍රියා පටිපාටියෙන් පරිබාහිරව සම්මුඛ පරීක්ෂණ ඇගයීම් ලකුණු ලබාදී ඇති බවකි. එතුලින්, පැමිණිලිකරුට සත්‍ය වශයෙන්ම හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය ප්‍රදානය කර තිබේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් සඳහා නියමිත ලකුණු 20 ලබාදීමේදී වගඋත්තරකාර සංස්ථාව විසින් පිළිගත් ක්‍රමවේදය අනුව ලකුණු ලබාදීමට කටයුතු කර නොමැති බව වගඋත්තරකරු විසින් පිළිගෙන ඇත. එබැවින් ඉදිරිපත් කිරීමේ කුසලතා / භාෂා ප්‍රවීනත්වය සඳහා ලකුණු 05, ධනාත්මක ආකල්ප සහ විශ්වාසය, නව අභියෝග වලට මුහුණදීමට ඇති සූදානම / අනාගම ලගාකර ගැනීම් සඳහා පවතින පැහැදිලි දැක්ම හා සැලැස්ම සඳහා ලකුණු 07 සහ අදාළ දැනුම සහ විෂයට අදාළ අත්දැකීම් / වගකීම් දැරීමට ඇති හැකියාව සඳහා ලකුණු 08 ක් වශයෙන් මුළු ලකුණු 20 න් පැමිණිලිකරුට ලකුණු 04 ක් ද තිලකරත්න යන අයදුම්කරුට ලකුණු 19 ක් ද වශයෙන් ලකුණු ලබා දුන් ආකාරය පැහැදිලි නොමැති අතර එය පැහැදිලි කර ගැනීම සඳහා කිසිදු ලිඛිත සටහනක් ද වගඋත්තරකරු විසින් තබා ගෙන නොමැත.

එම නිසා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු නිවැරදි පිළිගත් සහ අනුමත ක්‍රමවේදයට අනුව වගඋත්තරකරු විසින් සිදු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු අවම ලෙස පැමිණිලිකරුට ලබාදී ඇති අතර සෙසු අයදුම්කරුවන්ට ඉතා ඉහළ ලකුණු ලබාදී ඇත. පැමිණිලිකරු අභියෝගයට ලක් කරන ඩබ්.ඩී. තිලකරත්න යන අයදුම්කරුට ලකුණු 19 ක් ලබාදී ඇති අතර ඒ සඳහා යොදා ගත් නිර්නායක මොනවාද යන්නත් කෙසේ ලකුණු ලබාදීම සිදු කරන ලද්දේද යන්නත් වාචික හෝ ලිඛිත සාක්ෂි මගින්

තහවුරු කිරීමට වගඋත්තරකරු අසමත්ව ඇත. එබැවින් අදාල තනතුරට අපේක්ෂකයින් තෝරා පත් කර ගැනීමේ තීරණාත්මක ලකුණු 20 ක් වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු සාධාරණ ක්‍රමවේදයකට අනුව ලබාදීම සිදුවී නොමැති බව නිරීක්ෂණය වන අතර එතුලින් සෙසු අංශ සඳහා ලකුණු 57.11 ක් හිමි කරගත් පැමිණිලිකරුට අදාළ තනතුර හිමි නොවී සෙසු අංශ සඳහා ලකුණු 39.77 ක් ලබා ගත් ඩබ්.ඩී. තිලකරත්න යන අයදුම්කරුට ලබාදීම විධිමත් ආයතනික ක්‍රමවේදයක් අනුව සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු අභියෝගයට ලක් කරන තිලකරත්න යන අයදුම්කරුට සම්මුඛ පරීක්ෂණයේ දී ලබාදුන් ලකුණු 58.77 හි 60 % ක ප්‍රතිශතය වන ලකුණු 35.2 ක් ද ලිඛිත පරීක්ෂණය සඳහා ලබා දුන් ලකුණු 68.5 න් 40 % ක ප්‍රතිශතය වන ලකුණු 27.4 සමග මුළු ලකුණු 62.66 ක් ලබාදී ඇත. එසේම, පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී ලබා දුන් ලකුණු 61.11 හි 60 % ක ප්‍රතිශතය වන ලකුණු 36.66 ක් ද ලිඛිත පරීක්ෂණය සඳහා ලබා දුන් ලකුණු 62 න් 40 % ක ප්‍රතිශතය වන ලකුණු 24.8 සමග මුළු ලකුණු 61.46 ක් ලබා දී ඇත. මෙහිදී තීරණාත්මක ලකුණු 20 වන සම්මුඛ පරීක්ෂණ ඇගයීම් ලකුණු ලබාදීමේදී පැමිණිලිකරුට 20 න් 4 ක් ද තිලකරත්න යන අයදුම්කරුට ලකුණු 20 න් 19 ක් ද වශයෙන් කිසිදු විධිමත් ක්‍රමවේදයකින් තොරව ලබාදීම තුලින් ලකුණු 1.20 ක පරතරයක් පැමිණිලිකරු සහ තිලකරත්න යන අයදුම්කරු අතර ඇතිවී ඇත. එම ලකුණු 1.20 ප්‍රමාණවත් නොවීම මත පැමිණිලිකරුගේ අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව අදාළ තනතුර සඳහා තෝරාපත් කර ගත් අයදුම්කරුවන් හැර මීළගට වැඩිම ලකුණු ලබාගත් පැමිණිලිකරුට අදාළ තනතුර ලැබීමේ හිමිකම පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

නිගමනය

ඉහත දක්වන ලද කරුණු අනුව සලකා බැලීමේදී ජ්‍යෙෂ්ඨ කාර්මික ඉංජිනේරු තනතුර සඳහා කාර්මික ශිල්පීන් තෝරා පත් කර ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම සඳහා නිසි සාධාරණ, විනිවිද භාවයකින් යුතු ක්‍රමවේදයක් ආයතනය තුළ පවතිද්දී එම ක්‍රමවේදය අනුගමනය නොකර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සිය අභිමතය අනුව අත්තනෝමතික ලෙස සම්මුඛ පරීක්ෂණ ඇගයීම් ලකුණු ලබාදීම තුලින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විධිමත් ලෙස ලකුණු ලබාදීම සිදුකර නොමැති වීම නිරීක්ෂණය වන අතර ඒ මගින් පැමිණිලිකරුට සාධාරණ ලකුණු ලැබීමේ අවස්ථාව අහිමිව ඇති බැවින් පැමිණිලිකරුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුලින් උල්ලංඝණය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. දැනට වගඋත්තරකාර ආයතනය තුළ පුරප්පාඩුවක් පවතින බවට වාර්තා වන බැවින් පැමිණිලිකරු බී/1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කාර්මික ශිල්පී තනතුරෙහි පිහිටුවීම සිදු කළ යුතු ය.

2. ආයතනයේ සේවකයින්ට බලපාන්නා වූ සම්මුඛ පරීක්ෂණ වලදී වඩා වගකීමකින් හා සැලකිලිමත්භාවයකින් කටයුතු කිරීමටත්, මෙවැනි තත්වයන් නැවදුරටත් ඇති වීම වැළැක්වීමට පියවර ගැනීමටත් වගඋත්තරකාර පාර්ශවය විසින් වගබලා ගත යුතු ය.

3. මෙම සිදුවීමට අදාලව කරුණු විමර්ශනය කර නැවත මෙවැනි තත්වයන් ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස වගඋත්තරකාර පාර්ශවය වෙත අවශ්‍ය උපදෙස් ලබාදීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 08 . 28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමටට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු )
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01 අමාත්‍යතුමා,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය,
437, ගාලු පාර,
කොළඹ 03.
\- කරුණු දැන ගැනීම සඳහා

02 ලේකම්,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය,
437, ගාලු පාර,
කොළඹ 03.
\- අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා